# මධ්‍යම පරිසර අධිකාරිය
மத்திய சுற்றாடல் அதிகாரசபை
**Central Environmental Authority**

"පරිසර පියස", 104, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பரிசர பியச", 104, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை, இலங்கை.
"Parisara Piyasa", 104, Denzil Kobbekaduwa Mawatha, Battaramulla, Sri Lanka . Web : www.cea.lk


අපේ යොමුව / எமது தொடர்பு / Our Ref. CEA/06/EPU/PR/39/2022 ඔබේ යොමුව / உமது தொடர்பு / Your Ref. දිනය / திகதி / Date 2023.10.10

## මාධ්‍ය නිවේදනය

### දිවයින පුරා නෙල්ලි පැළ 28,000ක් සිටුවීමේ ව්‍යාපෘතිය ඇරඹුණා...

නෙල්ලි පැළ 28,000ක් දිවයින පුරා තෝරාගත් ස්ථානයන්හි සිටුවීමේ ව්‍යාපෘතියක් පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය එක්ව දියත් කර ඇත. මේ අනුව, එක් දිස්ත්‍රික්කයකට පැළ 1,000 බැගින් දිස්ත්‍රික්ක 25 සඳහා පැළ 25,000ක් සිටුවීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති අතර ඉතිරි පැළ 3,000 මධ්‍යම පරිසර අධිකාරියේ මැදිහත්වීම මත කැලණි ගං ද්‍රෝණියේ තෝරාගත් ස්ථානයන්හි සිටුවීමට සැළසුම් කර තිබේ.

කෝප් 28 සමුළුවට සමගාමීව පරිසර අමාත්‍ය ඉංජිනේරු නසීර් අහමඩ් මහතාගේ යෝජනාවකට අනුව පැළ 28,000ක් සිටුවීම සඳහා කටයුතු යොදමින් සිටි අවස්ථාවේ පූජ්‍ය කොටපොල අමරකිත්ති ස්වාමීන් වහන්සේ විසින් නෙල්ලි ගස් සිටුවීමේ වැදගත්කම පිළිබඳ ව්‍යාපෘති යෝජනාවක් පරිසර අමාත්‍යතුමන් වෙත ඉදිරිපත් කරනු ලැබ තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම යෝජනා ද්විත්වයම සුසංයෝග කරමින් නෙල්ලි පැළ 28,000ක් සිටුවීමේ මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

දේශගුණ විපර්යාස මගින් ඇතිවන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා ගත හැකි පියවරක් ලෙස සහ කාබන් පියසටහන අවම කිරීම සඳහා ගත හැකි පියවරක් ලෙස වන වැස්ම (වන ගහනය) වැඩිකිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ආයුර්වේදයට අනුව බොහෝ රෝග සමනය සඳහා භාවිතවන ඖෂධයක් සහ පළතුරක් ලෙස නෙල්ලි ශාකය ඉතා වටිනා ඖෂධීය ශාකයක් වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ දී සිටුවීම සඳහා නෙල්ලි ශාක තෝරා ගන්නා ලදී.

ව්‍යාපෘතියේ සමාරම්භය පූජ්‍ය කොටපොල අමරකිත්ති ස්වාමීන් වහන්සේ, පරිසර අමාත්‍ය ඉංජිනේරු නසීර් අහමඩ් මහතා, ශ්‍රී ලංකාවේ ඊජිප්තු තානාපති මොස්ලෙෂ් (Moselesh) මහතා, ශ්‍රී ලංකාවේ පිහිටි එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති කාර්යාලයේ රශෙඩ් අල් මසරෝයි (Rashed Al Mazaroouei) මහතා, මධ්‍යම පරිසර අධිකාරියේ සභාපති සුපුන් එස්. පතිරගේ මහතා, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් පී. බී. හේමන්ත ජයසිංහ මහතා, කොළඹ රාජකීය විද්‍යාලයේ විදුහල්පති තිලක් වත්තුහේවා මහතා සහ ටීජේ ලංකා සමූහයේ ප්‍රධාන විධායක නිලධාරී පුබුදු ද සිල්වා මහතා යන සම්භාවනීය අමුත්තන්ගේ ප්‍රධානත්වයෙන් පසුගියදා(26) පැවැත් විය. මෙදින සම්භාවනීය අමුතුතන් විසින් නෙල්ලි පැළ දහයක් කොළඹ රාජකීය විද්‍යාල පරිශ්‍රයේ රෝපණය කරන ලදී. මෙම අවස්ථාවට නිලධාරීහු සහ පාසැල් සිසුදරුවෝ සහභාගී වූහ. නෙල්ලි පැළ 28,000ක්

සිටුවීමේ මෙම ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතනයන්හි සහයෝගය සහ සහභාගීත්වය ලබා ගැනීමට කටයුතු යොදා ඇති අතර ටීජේ සමූහයේ දීර්ඝ කාලීන පරිසර දැක්ම වන "අභිවර 2023" වැඩසටහනට සමගාමීව ටීජේ ලංකා සමූහය මෙම ව්‍යාපෘති සඳහා ප්‍රධාන අනුග්‍රාහක දායකත්වය සපයයි. ව්‍යාපෘතියේ සංවිධාන කටයුතු සහ මෙහෙයවීම සිදුකරනු ලබන්නේ පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය විසිනි.

මාධ්‍ය සම්බන්ධීකරණය - මාධ්‍ය නිලධාරී - ශ්‍රියාන්ජනී ලොකුලියන - 0776252288

සුපුන් එස්. පතිරගේ
සභාපති
මධ්‍යම පරිසර අධිකාරිය